**ශීර්ෂය 157- ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 157 - ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 672.26 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 452.10 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 220.16 ක් හෙවත් සියයට 32.74 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 363.25 | 327.39 | 35.86 | 9.87 |
| මූලධන | 309.01 | 124.71 | 184.30 | 59.64 |
| **එකතුව** | **672.26** | **452.10** | **220.16** | **32.74** |

## 2.2 රජයේ නිලධාරින්ට අත්තිකරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 15701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 18.00 | 15.45 | 6.50 | 7.46 | 60.00 | 30.10 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0362/0016/000 දරන අග්‍රිම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.127 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 43,579 ක් විය.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.** |
| 6000/0000/00/0013/0107/000 | 30,304 |
| 6000/0000/00/0018/0101/000 | 13,275 |
| **එකතුව** | **43,579** |

## 2.5 විගණන නිරීක්ෂණය

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

----------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඈ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ඉ) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454 | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) | අමාත්‍යාංශය හා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලයේ ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| (උ) | සාමාජික ණය ලේඛනය | මුදල් රෙගුලාසි 502 | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විසර්ජන ගිණුම

-------------------

#### 3.2.1 අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබූ රු.1,450,000 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබූ රු. 50,900,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 33 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 98 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වැඩ තහනමට ලක් වූ නිලධාරින්ගෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.235,320 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 4 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2014 ජනවාරි 01 දින කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්ට අයිති ගොඩනැගිලි සහිත බිම් කොටසක් මෙම අමාත්‍යාංශයට පවරා දී තිබූ අතර, 2015 හා 2016 වර්ෂවලදී එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිළිවෙලින් රු.9,998,311 ක් හා රු.254,259 ක් වැයකර තිබුණි. මෙම ඉඩම හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) විධායක හා රැස්වීම් මේස, පුටු මිලදි ගැනිමේදි අයකරන ලද බදු වටිනාකම හා වායුසමීකරණ සවිකිරිමේ වියදම වත්කමේ පිරිවැයට ඇතුළත් නොකිරිම නිසා කාර්යාල උපකරණවල වටිනාකම රු. 557,505 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**3.5 කාර්යසාධනය**

---

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රාජ්‍ය නොවන සංවිධානවල අධීක්ෂණ කටයුතු කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 21 දෙනෙකු පත්කර තිබුණි.මෙම නිලධාරීන්ගේ කාර්යසාධනය මැනීම සඳහා එම කාර්යාලය විසින් සකස්කරන ලද කාර්යසාධන මැනීමේ නිර්නායකවලට අනුව කාර්යසාධන වාර්තා ලබාගත යුතු වුවද , පසු විපරම් අංශය (Monitoring unit) විසින් 2016 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තා ලබාගෙන නොතිබුණි.

(ii) රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ මහ ලේකම් කාර්යාලය යටතේ රාජ්‍ය නොවන සංවිධාන 1500 ක් ලියාපදිංචි කර තිබුණ ද, සංවිධාන සියල්ලම ක්‍රියාකාරීත්වයේ නොපවතින අතර, වර්තමානය වනවිට ක්‍රියාකාරීව පවතින සංවිධාන ගණන 575 ක් විය. මෙම සංවිධාන වලින් 175 ක් පමණක් අනුමත ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කර තිබුණද, කිසිදු සංවිධානයක් විසින් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2015 – 2017 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මධ්‍ය කාලීන භාෂා සැලැස්මෙහි අඩංගු ක්‍රියාකාරකම්වල ප්‍රගති සමාලෝචනය මාස 03 කට වරක් සහ වාර්ෂිකව සිදුකල යුතු වුවද, ඒ අනුව ප්‍රගතිය මැනීමක් හෝ පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

## 3.6 අවිධිමත් ගනුදෙනු

---------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් සහජීවනය ප්‍රවර්ධනය සඳහා රු. 1,459,120 ක් වැයකර වැඩමුළු 03 ක් පැවැත්වීම සඳහා ස්ථාන තෝරා ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) විශ්ව විද්‍යාල සිසුන් හා ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගිවූවන් සඳහා සම්මන්ත්‍රණ බෑග් 285ක් මිලදී ගැනිමට රු. 411,961ක් වැයකර තිබූ අතර, මිලදී ගැනීමේ දී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ)සහ (ඊ) මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව මිලදී ගෙන තිබුණි.

## 3.7 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

විදේශ නිවාඩු ලබා සිටි ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාරවරියක 2013 දෙසැම්බර් මාසයේ සිට සේවයට වාර්තා නොකිරීම මත, නිවාඩු අයදුම් කිරීමේදී අත්සන් කරන ලද ගිවිසුම් පත්‍රය ප්‍රකාරව රජයට ගෙවිය යුතු රු.97,400 ක මුදල විගණිත දිනය වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 14 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 432 | 268 | 164 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 111 | 96 | 15 |
| | **එකතුව** | **571** | **381** | **190** |

පුරප්පාඩුව පවතින ද්විතියික මට්ටමේ තනතුරු 164 ට සංවර්ධන නිලධාරි තනතුරු 32 ක් රාජ්‍ය කළමණාකරන සහකාර තනතුරු 27 ක් හා ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක තනතුරු 90 ක් ඇතුළත්ව තිබුණි.